
අපගේ ගැටළු
පතුලෙහි ඇත්තේ
කුමක්ද?

‘‘අප ජීවත්වන මෙම ලොවෙහි මෙතරම් චංචල භාවය, කණස්සලු භාවය සහ එකිනෙකා ගැන අවිශ්වාසකම පවතින්නේ මන්ද?’’ යන ඉපැරණි ප්‍රශ්නය මනුෂ්‍ය සංහතියේ ආරම්භයේ සිට මිනිසාට පීඩා කරන ප්‍රශ්ණයකි.

අධ්‍යාපනයට හෝ සැප සම්පත් වලට ජීවිතයේ ගැටළු ඉවත් කිරීමට හැකියාවක් නොමැති අතර, එම කරුණු තව තවත් ගැටළු පිළිබඳව අවබෝධය නහා සිටුවීමට ඉවහල් වේ. සිතට වද දෙන මෙම ප්‍රශ්නයෙන් ඉතා ධනවත් මෙන්ම ඉතා දිළිඳු අය එක ලෙස පීඩා විඳිති.

**නියම හේතුව:—**

ඇත්ත වශයෙන්ම මෙම ගැටළු, අභ්‍යන්තරික සදාචාර ප්‍රශ්නයක බාහිර රෝග ලක්ෂණ පමණි. මනුෂ්‍යයන් හැටියට අප යම් දිනක ගණන් දිය යුතු, සර්වබලධාරී දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද, ඉතාම හොඳ සහ ඉතාම උසස් දායාදය ප්‍රතික්ෂේප කිරීමේ, එපා කිරීමේ වරද නිසා අපගේ සිත තුළ නිරතුරුවම පරාජිත, අවුල් වූ, විනාශවූ හැඟීමක් තිබේ. එබැවින් අප මෙම දෙවියන් වහන්සේ හා සමග එකඟතාවයක් නොමැති බව හැඟී යයි.

මෙම සියලු කරුණුවලට මුල්වන මූලික හේතුව පාපයයි. එනම් දෙවියන්වහන්සේට විරුද්ධ වී මුරණ්ඩු වීමයි. එහි අර්ථය අපි සියලු දෙනාම දනිමු.





එනම් දෙවියන්වහන්සේ හා එකඟත්වයක් නො දැරීමයි. පාපය නම් වැරදි තේරීම හේතු කොට ගෙන වැරදි ලෙස ක්‍රියා කිරීමයි. කෙටියෙන් ප්‍රකාශ කළහොත් එය නම්, ධර්මිෂ්ඨකමට, සත්‍යයට හා ප්‍රේමයට එරෙහිව නැඟී එන මෙන්ම දෙවියන්වහන්සේගේ සර්වබලධාරී පාලනයට එරෙහිව නැඟී එන ස්ව කැමැත්ත ක්‍රියාවේ නැංවීමය. මනුෂ්‍ය හෘදයෙහි පාපය නානා ප්‍රකාරවද, නානා මට්ටමින්ද, ක්‍රියාත්මක වේ.

පාපය නිසා මිනිසා දෙවියන්වහන්සේට විරුද්ධ වෙනවා පමණක් නොව, එම පාපය කරණ කොට ගෙන මිනිසාටද හානි සිදුවේ. හිතෝපදේශ 8:36 පවසන පරිදි ‘මාගෙන් මුලාව යන්නා තමාගේම ප්‍රාණයට අනතුරු කරගන්නේය’ කියාද ගලාති 6:7 ‘මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපාගන්නේය’ කියාද සඳහන් වේ. පාපයේ ප්‍රතිඵලය මෙම ජීවිතයේ මෙන්ම මින් පසු ජීවිතය කෙරෙහිද බලපානු ඇත.

**මරණය–පාපයට ප්‍රතිකාරයක් නොවේ.**

මරණයත් සමගම ජීවිතයේ ප්‍රශ්න සියල්ල අවසාන වේවායි කියා සිතීමට බොහෝ දෙනා කැමතියි. එහෙත් මෙම ශාරීරික ජීවිතයේ අවසානයත් සමගම පාපයේ බලපෑම අවසාන නො වනු ඇත. නිවසක් කඩා දැමීමෙන් නිවැසියන්ගේ චරිතයෙහි වෙනසක් සිදු නොවන්නාක් මෙන්.



පාපිෂ්ඨයෙකු මරණයට පත් වුවද එයින් ඔහුගේ පාපිෂ්ඨ ස්වභාවයේ අවාසනාවන්තකම කෙළවර නොවේ. වෙනස් නොවේ. ‘‘නුමුත් භය ඇත්තන්ටත්, අවිශ්වාස කරන්නන්ටත්, පිළිකුල්ව සිටින්නන්ටත්, මිනී මරන්නන්ටත්, වේශ්‍යාකම් කරන්නන්ටත්, මායාකාරයන්ටත්, රූප වඳින්නන්ටත්, සියලු බොරුකාරයන්ටත්, ගින්නෙනුත්, ගෙන්දගම්නුත් දැවෙන විලෙහි තමන්ගේ කොටස වන්නේය. එය දෙවෙනි මරණයයි.’’ (එළිදරව් 21:8).

මනුෂ්‍යයෝ පාපය හේතු කොට ගෙන දැනට මෙලොව දුක් විඳිති. මෙයට පසු ජීවිතයේදී පාපය ගැන ඇති අවබෝධය කෙසේ බලපායිද? එවිට, මෙලොවේ තිබෙන ආශාවන්, උද්‍යෝගිමත් භාවයන් සහ සියලු මායාවන් නිමවූ කල, පසුතැවිලි නොවූ තැනැත්තා පාප කෙරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය නම් වූ භයානක සත්‍යතාවයට ඔහු පිබිද මුහුණ දෙයි.

අපව ගළවා ගැනීමට අපට නොහැකිය. අපගේ ප්‍රාණය විනාශ කිරීම පිණිස අපට විරුද්ධව නැඟී සිටින සතුරන් ඉතා ප්‍රබලය. පාපයෙන් නිදහස ලබා දීමට සමත්කමක් දේශපාලන වෙනස් වීම්වල නොමැත. පරිසරයේ වෙනසකින්ද එය ඉටු නොවේ. ශාරීරික හෝ මානසික, විද්‍යාත්මක හෝ ආචාර ධර්ම ක්‍රම මඟින් එයට පිළියමක් නො ලැබේ.

**ඇති එකම ප්‍රතිකාරය:-**

අපව පාපයෙන්, එහි බරින් හා වෙලුමෙන්, එහි විසෙන් හා රෝගයෙන්, එහි වරදක ර හැඟීමෙන් හා වේදනාවෙන් මුදවා ගැනීමට හැකියාව ඇත්තේ අප විරුද්ධ පව් කළ තැනැත්තාට පමණයි. ''වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපගේ ගැළවීමට අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේය.'' (ක්‍රියා 4:12.)

දෙවියන්වහන්සේ පාපය කෙරෙහි දක්වූ ආකල්පය මනාව වටහාගත හැක්කේ යේසුස්වහන් සේගේ කුරුසිය තුළිනි. පාපයේ විනාශකාරී බලපෑම ඉවත්කර දැමීම සඳහා සමත්වූ එකම පිළියම වන්නේ මිනිස් බව ලැබූ දෙවියන්වහන්සේගේ මරණය පමණයි. එම දිව්‍යමය පූජාව තුළින්, දිව්‍යමය වූ පව් සමාව හා පාපයට සුවය අපට හිමිවී තිබේ. ''උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන් සේගේ ලෙයද සියලු පාපවලින් අප පවිත්‍ර කරන් නේය.'' (යොහන් 1:7).

ක්‍රිස්තුස්වහන්සේ ඔබව පාපයෙන් මුදවා ගැනීම පිණිස ඉතා උනන්දුවෙන් බලා සිටින සේක. ''මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ සොයාගන්ටත් ගළවාගන්ටත් ආසේක.'' (ලූක් 19:10). ''මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසද, එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10).



පාපයේ වරදකාරීභාවයෙන් හා පාපයේ බලයෙන් නිදහස්වීමට ඔබ උවමනාවෙන් සිටිනවාද? එසේ නම් දැන්ම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණ ඔබගේ පව් එතුමාට කියා සිට, එම පාපයන්ගෙන් ඔබ මුදවන පිණිස එතුමා කුරුසියේ දුක්විඳ මළ බව පිළිගන්න. පෞද්ගලිකව යටත්වීමෙන් සහ විශ්වාසයෙන් යුතුව එතුමාට ඔබගේ ජීවිතය බාර කරන්න. ''මා වෙතට එන තැනැත්තා මා විසින් කිසිසේත් අහක දමන්නේ නැතැ''යි උන්වහන්සේ කීසේක.'' (යොහන් 6:37).